සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 7 - ශ්‍රේණිය

28681

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය:- ...................................................................................... කාලය: පැය 2යි.

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.
- පහත සඳහන් ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(01) පළමු සංගායනාවේ දී ඇති වූ වැදගත් දෙයක් වන්නේ ඒ ඒ ධර්ම කොටස් කට පාඩමින් පවත්වාගෙන යෑමට භාණක පරම්පරාවක් ඇතිවීම ය. ඒ අනුව ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට පවරන ලද්දේ,

1. දීඝ නිකායයි.
2. මජ්ඣිම නිකායයි.
3. ඛුද්දක නිකායයි.
4. සංයුක්ත නිකායයි.

(02) බුදු දහමෙහි "වුද්ධාපචායනය" යනුවෙන් දක්වා ඇත්තේ කුමක් ද?

1. දන් දීමයි.
2. අනුන්ට උදවු කිරීමයි.
3. වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීමයි.
4. අභිවෘද්ධිය සලසා ගැනීමයි.

(03) වේළුද්වාර සූත්‍රයේ දැක්වෙන අන්දමට කයින් සිදු වන වැරදි,

1. තුනකි.
2. හතරකි.
3. පහකි.
4. දෙකකි.

(04) රහතන් වහන්සේ,

1. පින් වැඩි උතුමෙකි.
2. පින්, පව් දුරු කළ උතුමෙකි.
3. පව් දුරු කළ උතුමෙකි.
4. පින් දුරු කළ උතුමෙකි.

(05) "කොතරම් අකුසල කර්ම සිදු කළ ද පුද්ගලයා උපක්‍රමශීලීව ක්‍රියා කරයි නම් ඔහුට සැප ලැබිය හැකිය" මෙය අයත් වන්නේ කිනම් සම්පත්තියට ද?

1. කාල සම්පත්තියට.
2. උපධි සම්පත්තියට.
3. ගති සම්පත්තියට.
4. පයෝග සම්පත්තියට.

(06) සමන් පාසල ඇරී නිවසට පැමිණියේ ධාරානිපාත වර්ෂාවේ තෙමීගෙන ය. මෙයට අදාළ නියාම ධර්මය වනුයේ,

1. කම්ම නියාම ය.
2. චිත්ත නියාම ය.
3. බීජ නියාම ය.
4. උතු නියාම ය.

(07) උදෑසනින් පිබිද ගෙවත්තට යන විට නෙත ගැටෙන්නේ නෙක මල්වලින් පිරි සුවඳ හමන මල් ගොමුවකි. රොන් උරන මීමැස්සන්ගේ ගුමු ගුමුවකි. අත් තටු සලා මලින් මලට යන සමනළ රැනකි. මේ දසුනින් බෞද්ධයා අත් විඳින්නේ,

1. නිරාමිස සතුටයි.
2. සොබාදම් අසිරියයි.
3. ගෙවත්තේ චමත්කාරයයි.
4. උදෑසන මිහිරියාවයි.

(08) "මගේ ජීවිතයට මා ප්‍රිය කරන්නා සේ අන් අය ද තම තමන්ගේ ජීවිතයට ප්‍රිය කරති. හිංසනයට ප්‍රිය නොකරති. දඬුවමට බිය වෙති." මෙයින් කියැවෙන්නේ,

1. අන් අය ගැන වෙහෙසීම ය.
2. යහපත් පුද්ගල ස්වභාවයයි.
3. අත්තූපනායක ධර්මයයි.
4. සමාජයට ලැදි බවයි.

(09). ආහාර ගැනීමේ යහපත් පුරුද්දක් නොවන්නේ,

1. තමාට අවශ්‍ය ප්‍රමාණයට ආහාර බෙදා ගැනීම.
2. වැඩිහිටියන්ට පළමුව ආහාර පිළිගැන්වීම.
3. බඳුනේ ඇති ආහාර පිළිවෙළින් අනුභව නොකිරීම.
4. ඉඳුල් තැවරුණු අතින් ජල බඳුන්, හැඳි ආදිය නොඇල්ලීම.

(10) නිවන් ලබා ගැනීම සඳහා අදාළ නොවන්නේ,

1. දුකට හේතුව තෘෂ්ණාව බව වටහා ගැනීම.
2. චතුරාර්ය සත්‍ය තේරුම් ගැනීමේ නුවණ.
3. නිවන් මඟ නම් මැදුම් පිළිවෙත බව වටහා ගැනීම.
4. තෘෂ්ණාව නැති කළ නොහැකි බව වටහා ගැනීම.

- පහත සඳහන් වාක්‍ය හරි නම් '✓' ලකුණ ද වැරැදි නම් '×' ලකුණ ද යොදන්න.

(11) දම්සක් පැවතුම් සූත්‍රය අසා කොණ්ඩඤ්ඤ තවුසා රහත් ඵලය ලැබීය. ( )

(12) රෝගී වූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ දකීමට බුදුන් වහන්සේ වැඩම කළහ. ( )

(13) පස් පවින් වැළකී පන්සිල් රකින්නා මිනිස් අයිතිවාසිකම් රකින්නෙකි. ( )

(14) මෙණ්ඩක සිටුතුමා බුදු රදුන්ගෙන් බණ අසා සෝවාන් විය. ( )

(15) සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, ධර්ම ප්‍රදීපිකාව යන පැරණි ග්‍රන්ථ අද දක්නට නැත. ( )

- A කොටසට ගැළපෙන නිවැරැදි පදයක් B කොටසේ ඇත. එය තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| (16) දහම් පොතපත ලිවීම හා ලියවීම | පුණ්ණ හිමි |
| (17) කාව්‍යශේඛරය | මහා කාශ්‍යප හිමි |
| (18) සුනාපරන්තය | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| (19) මහා ලතා පසාධනය | අට මහ පින්කම් |
| (20) පළමු සංගායනාව | විශාඛාව |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවලට 10 බැගිනි.**

---

01. ඔබ පන්තියේ බුද්ධ ධර්ම විෂයට අදාළව තුන් වැනි වාරයෙහි "බෞද්ධ නායකත්ව භූමිකාව" සම්බන්ධ ව කරුණු ඉදිරිපත් කෙරෙන ක්ෂණික කතා වාරයක් පවත්වන ලදී. ඊට අදාළව කෙටි පිළිතුරු සපයන්න.

(i) ක්ෂණික කතා වාරය සඳහා ඔබ සූදානම් වූ ආකාරය දක්වන්න.

(ii) ඒ සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.

(iii) ඔබ මුහුණ දුන් අභියෝග (බාධක) දෙකක් ලියන්න.

(iv) ඔබ ලැබූ ඉගෙනුම් අත්දැකීම් දෙකක් ලියන්න.

(v) නලපාන ජාතකයෙහි එන නායක වඳුරාගේ නායකත්ව ලක්ෂණ දෙකක් ලියන්න.

(vi) ශිෂ්‍ය නායකයෙකු, නායිකාවක ලෙස ඔබ තුළ ඇති කරගත යුතු නායකත්ව ලක්ෂණ දෙකක් ලියන්න.

(vii) වගකීම් ඉටු කිරීමේ නිදසුන් දෙකක් ආනන්ද හිමියන්ගේ චරිතයෙන් දක්වන්න.

(viii) වගකීම් ඉටු කිරීමේ මහඟු ආදර්ශ දෙකක් සම්බුදු සිරිතෙන් ගෙන හැර දක්වන්න.

(ix) බුදු සසුනෙහි වගකීම් ඉටු කළ අගසව් දෙදෙන නම් කරන්න.

(x) පන්තියේ ප්‍රදර්ශනය කිරීම සඳහා නායකත්ව ගුණ ඇතුළත් ආදර්ශ පාඨ දෙකක් ලියන්න.

(2 × 10 = 20)

02.

i. ලුණු කැට උපමාව සඳහන් වන සූත්‍රයේ නම කුමක් ද? (ලකුණු 02)

ii. එලූප ජීවී සූත්‍රයේ දක්වෙන උට්ඨාන එලූප ජීවී හා කම්ම එලූප ජීවී යන පුද්ගලයින් දෙදෙනා හඳුන්වන්න. (ලකුණු 03)

iii. ගිරිමානන්ද හිමියන්ට පෙන්වා දුන් රෝග හටගන්නා හේතු අටෙන් පහක් ලියන්න. (ලකුණු 05)

03.

i. පාප මිත්‍ර සේවනය නිසා සිදු වන අයහපත් ප්‍රතිඵල දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වෙන තමන් සතු ධනය, සම්පත් විනාශ කර ගන්නා පුද්ගලයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

iii. අලසකම ඉගෙනීමට බාධාවකි. අලසයාගේ ගති ලක්ෂණ පහක් පාඩමට අදාළව දක්වන්න.

(ලකුණු 05)

04.

i. වචනයෙන් සිදු වන වැරැදි දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ඒ දෙක කෙටියෙන් විස්තර කරන්න.. (ලකුණු 03)

iii. වචනය සංවර කරගැනීමේ වැදගත්කම දක්වන්න. (ලකුණු 05)

05.

i. සිදුහත් බෝසත්තුමාගේ මුල් ගුරුවරු දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

ii. කිඹුල්වත්පුර ගමනේ දී පැවිදි වූ ශාක්‍ය කුමාරවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

iii. කිඹුල්වත්පුර ගමනේ දී සිදු වූ වැදගත් සිදුවීම් පහක් දක්වන්න. (ලකුණු 05)

06.

i. මෛත්‍රී කරන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. මෛත්‍රී කිරීම තුළින් ලැබිය හැකි ආනිසංස තුනක් දක්වන්න. (ලකුණු 03)

iii. කරණීය මෙත්ත සූත්‍රයේ නිදාන කතාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

07.

i. සිගාලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ කා හට ද? කොහේ දී ද? (ලකුණු 02)

ii. ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටු විය යුතු යුතුකම් තුනක් දක්වන්න. (ලකුණු 03)

iii. ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටු විය යුතු යුතුකම් පහක් නම් කරන්න. (ලකුණු 05)

ස .......... ය